# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1982/15 - 2016 අගෝස්තු මස 30 වැනි අඟහරුවාදා - 2016.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව

සංශෝධන අංක 01

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1894/26 දරන 2014.12.26 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ අන්තර්කාලීන විධිවිධානයන්හි 15.4 යටතේ පහත වගන්තිය ඇතුළත් කර සේවා ව්‍යවස්ථාව සංශෝධනය කරනු ලැබේ.

15.4 2009.07.01 දිනට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවේ සේවයේ I පන්තියේ III ශ්‍රේණියට හෝ I පන්තියේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද හා 2009.07.02 දිනට හෝ ඉන්පසුව I පන්තියේ II ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන් හට, 2018.12.31 දින දක්වා I පන්තියේ I ශ්‍රේණියට උසස් වීමේදී, අංක 1894/26 හා 2014.12.26 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදනය තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 10.5.1.1(i) වගන්තිය පරිදි සම්පූර්ණ කළ යුතු පශ්චාත් උපාධි සුදුසුකම වෙනුවට, එම වගන්තියේ දක්වා ඇති ක්ෂේත්‍රයක **පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්** සම්පූර්ණ කර තිබීම ප්‍රමාණවත් වේ.

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016 ජුනි මස 16 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දී ය.

09-592